


පළමුවන ශ්‍රේණියේ සිට
ශිෂ්‍යත්ව විභාගය දක්වා අවශ්‍ය

# සිංහල භාෂාවේ තනි පද















ප්‍රකාශනය - සැනැසි ප්‍රකාශන, මරදාන පාර, කොළඹ 10.
දුරකථන - 072 92 94794

රු. 80/=

[redacted]

පළමුවන ශ්‍රේණියේ සිට
ශිෂ්‍යත්ව විභාගය දක්වා අවශ්‍ය

# සිංහල භාෂාවේ තනි පද

සානුව සන්නාහය
අභියාචනය සාරාංශය
අසපුව
සේනාධිනායක
දෙපා පංකජ ඉපනැල්ල
ආක්‍රමණය නිරුද
වන්දිභට්ටයා කෘතවේදී
ප්‍රතිසංස්කරණය
අම්ල මෞලිමංගල්‍යය තාවක
පසල්ගම අරුණළු සීඝ්‍ර
කවන්ධය අනුකරණය පරපෝෂිත

## පළමුවන ශ්‍රේණියේ සිට
## ශිෂ්‍යත්ව විභාගය දක්වා අවශ්‍ය

## සිංහල භාෂාවේ

# තනි පද




තුන්වන මුද්‍රණය

**දයාවංශ ප්‍රකාශන**

මරදාන පාර, කොළඹ 10.

1. අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමියා
2. තමන් ගැන පමණක් සිතන්නා - ආත්මාර්ථකාමියා
3. දිවි ඇති තාක් - යාවජීව
4. ජලය නොමැති - නිරුදක
5. ලංකාවට අයත් - ලාංකික
6. කුඩා ම ප්‍රමාණය - අවම
7. වැඩි ම ප්‍රමාණය - උපරිම
8. කෙළෙහි ගුණ සලකන - කෘතවේදී
9. කළ ගුණ නොසලකන - අකෘතඥ
10. එම කාලයට අයත් - තත්කාලීන
11. සුළු කාලයකට අයත් - තාවකාලික
12. බොහෝ දුර සිතා මතා කටයුතු කරන - දූරදර්ශී
13. ඉබේ ක්‍රියාකරන - ස්වයංක්‍රීය
14. දෙකෙන් බෙදිය හැකි සංඛ්‍යා - ඉරට්ටේ
15. දෙකෙන් බෙදිය නොහැකි සංඛ්‍යා - ඔත්තේ
16. අඳුර වැටී ඒ බෝවෙන වේලාව - ගොම්මන
17. නෙත් පිනවන - නෙත්කලු
18. සිත් පිනවන - සිත්කලු



19. කන් පිනවන - කන්කලු
20. ජනතාව අඩු - ජනහීන
21. මෙරටට ගෙන එන - ආනයන
22. මෙරටින් විදේශවලට යවන - අපනයන
23. ඇඳුම් මසන්නා - සන්නාලියා
24. කොණ්ඩය කපන්නා - කරණවෑමියා
25. කෑම උයන්නා - අරක්කැමියා
26. සපත්තු මසන්නා - සපත්තේරුවා
27. ගමෙහි වාසය කරන්නා - ගැමියා
28. අනුන්ගේ ගුණ වර්ණනා කරන්නා - වන්දිභට්ටයා
29. ස්වාමියා මළ ස්ත්‍රිය - වැන්දඹුව
30. ජලය නැති කාලය - ඉඩෝරය
31. පාගන ලද ගොයම - මැඩුවම්
32. පරපුරෙන් පරපුරට පැවත එන - පාරම්පරික
33. රත්‍රන්වලින් කරන ලද - රන්මුවා
34. නළලට වැටෙන කෙස් රොද - කියඹු
35. උස් බිමක ඇති තැනිතලා බිම - සානුව
36. තාපසයන් වාසය කරන ස්ථානය - අසපුව

37. තමන්ගේ ම ආරක්ෂාව - ආත්මාරක්ෂාව

38. නගරයෙන් මඳක් දුරින් වූ ගම - පසල්ගම

39. යකඩින් කරන ලද - අයෝමය

40. දැවයෙන් කරන ලද - දැවමුවා

41. රිදීයෙන් කරන ලද -රජතමය/රිදීමය

42. ගලින් කරන ලද - ශෛලමය

43. සාමයට කැමති - සාමකාමී

44. සැමදා ම පවතින - සදාකාලික

45. ආහාර පානාදියෙන් වැළකී සිටීම - උපවාසය

46. පාද හතරක් ඇති - සිවුපා

47. සියලු දේ දන්නා - සර්වඥ

48. කියවීම සඳහා පොත් තබා ඇති ස්ථානය - පුස්තකාලය

49. දෑස ම නොපෙනෙන තැනැත්තා - අන්ධයා

50. ප්‍රගතියට යාමට කැමති - ප්‍රගතිශීලී

51. වියදම් අඩු කර ගැනීම - අරපිරිමැස්ම

52. බිය උපදින සුළු - බියජනක

53. පොත්පත් කියවන අය - පාඨකයෝ

54. සිනාව උපදවන්නා වූ - හාස්‍යජනක



55. බය උපදවන්නා වූ - බියජනක

56. නින්දට කැමති - නිද්‍රාශීලී

57. සමාජයට කැමති - සමාජශීලී

58. දෛවය ගැන අනාවැකි කියන්නා - දෛවඥයා

59. ඉබේ ම සිදුවන සිදුවීම - ස්වයංසිද්ධිය

60. පවුලක උපන් පළමු දරුවා - කුළුදුල්

61. විස්තර කැටිකර දැක්වීම - සාරාංශය

62. අහසත් මුහුදත් එකට එකතුවන සේ පෙනෙන - ක්ෂිතිජය

63. මිළ කළ නොහැකි - අමිල

64. ශරීරයේ ගල්වන සුවඳ දෑ - විලවුන්

65. යමක් දැන ගැනීමේ ආශාව - කුතුහලය

66. බොහෝ ඇසූ පිරූ තැන් ඇති - බහුශ්‍රැත

67. දොළොස් මසකට වරක් - වාර්ෂික

68. ආකාශයෙහි සැරිසරන - ආකාශචාරී

69. ගසක අතු බෙදෙන තැන - දෙබල

70. බිත්තරයෙන් උපන් - අණ්ඩජ

71. දියෙහි උපන් - ජලජ

72. මඩෙහි උපන් - පංකජ

73. සියල්ලම මරා දැමීම - සමූලඝාතනය
74. දෙමව්පියන්ගෙන් ලැබෙන ඉඩකඩම් හා ධනය - බූදලය
75. සැමට අයිති - පොදු
76. කාලයට උචිත - කාලෝචිත
77. ආහාර හිඟ කාලය - සාගතය
78. අනුන්ගෙන් පෝෂණය වන - පරපෝෂිත
79. ඉතා වේගයෙන් යන - ශීඝ්‍රගාමී
80. මඳ වේගයෙන් යන - මන්දගාමී
81. පැරණි යුගයට අයත් - පෞරාණික
82. පාද දෙකක් ඇති - දෙපා
83. බලවත් සතුටක් ඇති කරන - ආනන්දජනක
84. පොළොව යටින් යන මග - උමග
85. තිලයක් දරන තැනැත්තා - තිලධාරියා
86. ගඟෙන් මිනිසුන් එගොඩ මෙගොඩ කරන්නා - තොටියා
87. අන් අයට යටත්ව සිටීම - පරාධීන
88. දුරදිග බලා කටයුතු කිරීම - දූරදර්ශී
89. නගරයෙහි වාසය කරන්නා - නාගරිකයා
90. දියගොඩ දෙකෙහි ම ජීවත්වන - උභයජීවී



91. කැලෑවේ හටගන්නා ගින්න - ලැව්ගින්න
92. යුද්ධයට කැමති - රණකාමී
93. උසස් කුලයට අයත් - කුලීන
94. පහත් කුලයට අයත් - කුලහීන
95. සැම අයුරින් ම නිදහස් - ස්වෛරී
96. පවුලක බාලයා - බඩපිස්සා
97. රාත්‍රියෙහි හැසිරෙන - නිශාචර
98. කිසිදා නොමැරෙන - අමරණීය
99. රටක් බලයෙන් අල්ලා ගැනීම - ආක්‍රමණය
100. පාර වැරදුණු - මංමුලාවූ
101. සුරාවට බොහෝ ආසාකරන - සුරාසොඬ
102. බැතවල ඇති බොල් - කාටු
103. ගවයන් බලාගන්නා තැනැත්තා - ගොපල්ලා
104. හිස සුන් මළ කඳ - කවන්ධය
105. විසඳීමට අමාරු ගැටළුව - ප්‍රහේළිකාව
106. පාර පෙන්වන්නා - මාර්ගෝපදේශකයා
107. රටකින් තවත් රටකට යෑම - සංක්‍රමණය
108. ජනතාව බහුල වශයෙන් සිටින - ජනාකීර්ණ

109. යමක් ගැන ගැඹුරින් තොරතුරු සෙවීම - ගවේෂණය

110. නිරතුරු කතා කරන - දොඩමළු

111. පාද බොහෝ ගණනක් ඇති - බහුපා

112. පොළොවේ ඛනිජ වර්ග ඇති ස්ථානය - නිධිය

113. සියලුම පක්ෂ වලට අයත් - සර්වපාක්ෂික

114. සියලුම ආගම්වලට අයත් - සර්වආගමික

115. නීතියට ගරු කරන - නීතිගරුක

116. ගස්වලින් පිරුණ ප්‍රදේශය - වනගුම්භය

117. කැඩීබිඳී ගොස් ඉතිරි වූ කොටස් - නටඹුන්

118. සිතෙහි ඇතිවන බලවත් ආශාව - මනදොළ

119. වියළී ගිය ගොයම් ගස් - පිදුරු

120. දිරාගිය කිළිටි ඇඳුම් - වැරහිලි

121. රාත්‍රී කාලයෙහි සැරිසරන - නිශාචර

122. මාර්ගයෙහි ගමන් කරන තැනැත්තා - මගියා

123. වාහනයක් පදවන්නා - රියදුරා

124. පොත්පත් ආදිය ලියන තැනැත්තා - ලේඛකයා

125. සේනාවක සිටින ප්‍රධානියා - සේනාධිපති

126. සියලු සේනාවන්ගේ ප්‍රධානියා - සේනාධිනායක



127. කටට ආ දේ කියන - වාචාල

128. පුස් කොළයේ අකුරු ලිවීමට භාවිතා කරන දෙය - පන්හිඳ

129. සුවකළ නොහැකි - අසාධ්‍ය

130. ගෙයක් සෑදීමට සකස් කළ බිම් කොටස - ගෙපල

131. කාන්තාරයේ ජලය මෙන් දුරට පෙනෙන්නේ - මිරිඟුව

132. මාංශ අනුභව කොට ජීවත් වන - මාංශභක්ෂක

133. ශාක අනුභව කොට ජීවත් වන - ශාකභක්ෂක

134. මාංශ හා ශාක දෙවර්ගය ම අනුභව කරන - සර්වභක්ෂක

135. ව්‍යාපාරයට යොදන මුල් මුදල - ප්‍රාග්ධනය

136. බුද්ධත්වයට පෙරුම් පුරන තැනැත්තා - බෝධිසත්ව

137. රජයට ගෙවිය යුතු බදු - අයබදු

138. තමා උපන් රට - මව්බිම/නිජබිම

139. සහමුලින් ම උපුටා දැමීම - මූලෝත්පාටනය

140. තමා අවට ප්‍රදේශය - පරිසරය

141. පියා මැරූ තැනැත්තා - පීතෘඝාතක

142. මෑ, බෝංචි වර්ග ඇතුලත් ශාක කුලය - රනිල

143. කුමන හෝ ස්ථානයක තනිව හැසිරෙන්නා - ඒකචාරියා

144. ගස මැද තිබෙන තද කොටස - අරටුව

145. කිසිම ආයුධයක් නැති - නිරායුධ

146. මසුන් අල්ලා ජීවත් වන්නා - ධීවරයා

147. රටක ප්‍රධානතම නගරය - අගනුවර

148. ඉතා සුළු මොහොතකින් - ක්ෂණික

149. නිදි නොලබා අවදියෙන් සිටීම - නිදිවැරීම

150. කිරි බී වැඩෙන - ක්ෂීරපායි

151. විවාහයට පත් නොවූ කාන්තාව - මෙනවිය

152. විවාහ නොවූ - තනිකඩ

153. යමෙක් හෝ යම් සිද්ධියක් සිහිවීම පිණිස තනා ඇති දෙය - ස්මාරකය

154. උපසම්පදා නොවූ භික්ෂුව - සාමණේර

155. ප්‍රමාණය කළ නොහැකි - අපරිමිත

156. ඇසෙහි ගාන ආලේපය - නයනාලේපය

157. ඇස්වලට ප්‍රතිකාර කරන රෝහල - නයනාරෝග්‍යශාලාව

158. පසුපස එළවා යෑම - ලුහුබැඳීම

159. සතුන් පැමිණීම වැළැක්වීමට හේන වටා බඳින වැට - දඬුවැට

160. ඔටුණු පැළඳවීමේ උත්සවය - මෞලිමංගල්‍යය

161. මගීන්ට පහර දී ඔවුන් සතු දේ උදුරා ගැනීම - කොල්ලකෑම



162. කුඹුරක ලියද්දකින් ජලය බසින තැන - වක්කඩ

163. මළ අයකුගේ සිරුර පිළිස්සීම - ආදාහනය

164. මළ අයකුගේ සිරුර පොළොවේ වැළලීම - භූමිදානය

165. මරණයට කැපවූවෙක් නිදහස් කිරීම - අභයදානය

166. මැටි කර්මාන්තයේ යෙදුණු - කුඹල්

167. මුහුදෙහි ඇති ජලය - කරදිය

168. ඇළ, දොළ, වැව්, පොකුණුවල ඇති ජලය - මිරිදිය

169. ධර්මානුකූලව කටයුතු කරන්නා - ධර්මිෂ්ඨ

170. විද්‍යාත්මක පරීක්ෂණ පවත්වන ස්ථානය - රසායනාගාරය

171. පුරා වස්තු තැන්පත් කර ඇති ස්ථානය - කෞතුකාගාරය

172. මළ සිරුරු දවන ස්ථානය - ආදාහනාගාරය

173. මළ සිරුරක් දැවූ පසු ඉතිරි වන අළු - භෂ්මාවශේෂ

174. නිවස අවට පදිංචිව සිටින අය - අසල්වැසියෝ

175. වනයෙහි හැසිරෙන - වනචාරී

176. කිසිවෙකුටත් හිංසාවක් නොකරන - අහිංසක

177. ගොයම් කපාගත් පසු කුඹුරේ ඉතිරි වන කොටස - ඉපනැල්ල

178. හිරු උදාවට පෙර දැකිය හැකි ආලෝකය - අරුණලු

179. වැවක ජලය බැස යාමට ඇති ස්ථානය - සොරොව්ව

180. උසාවියක නඩු විසඳන තැනැත්තා - විනිශ්චයකරු
181. අනුන්ගේ සැප සම්පත් බලා අසතුටුවීම - ඊර්ෂ්‍යාව
182. කථා කිරීමෙහි ඇති හැකියාව - කථිකත්වය
183. මුල සිට අග දක්වා වැඩිවන ආකාරයට - අනුලෝම
184. අග සිට මුල දක්වා අඩුවන ආකාරයට - ප්‍රතිලෝම
185. උසාවියෙන් වරදකරුවන් වූවන් එල්ලා මරාදමන තැනැත්තා - අලුගෝසුවා
186. බැගෑපත්ව කරන ඉල්ලීම - ආයාචනය
187. නගරයට අධිපති - නගරාධිපති
188. දුටුවන් බියට පත් කරන - බියකරු
189. ඇළකින් එගොඩ වීමට ඇති ලීය - ඊදණ්ඩ
190. විදුහලක ප්‍රධානියා - විදුහල්පති
191. බලයට ඉතා කැමති - බලකාමී
192. තීන්දුවක් දුන් නඩුවක් නැවත විභාග කරන ලෙස ඉල්ලීම - අභියාචනය
193. පාරවල් තුනක් එකට එකතුවන තැන - තුන්මංසල
194. පාරවල් හතරක් එකට එකතුවන තැන - සිව්මංසල
195. සඟවා ඇති රන්රිදී මුතු මැණික් ආදී වස්තුව - නිධානය
196. මිතුරන්ට විරුද්ධව ක්‍රියාකරන - මිත්‍රද්‍රෝහී



197. රජයට විරුද්ධව ක්‍රියාකරන - රාජද්‍රෝහී
198. වේගයෙන් හමන සුළඟ - සුළිසුළඟ
199. කලාවට ලැදි - කලාකාමී
200. දැවදඬුවලින් භාණ්ඩ සාදන තැනැත්තා - වඩුවා
201. එකම කාලය තුල පැවති - සමකාලීන
202. අවවාද දෙන තැනැත්තා - අනුශාසක
203. ගසක එල නොලබන කාලය - අවාරය
204. ගඟක් මුහුදට වැටෙන ස්ථානය - මෝය
205. තමා සතු දේ දීමට අකැමති - මසුරු
206. නිදා ගැනීමට ඇති කාමරය - සයනාගාරය
207. මහණ වී සිට සිවුරු අරින ලද - උපැවිදි
208. සමිතියක මුදල් භාරව සිටින තැනැත්තා - භාණ්ඩාගාරික
209. ජලයෙන් වටවූ කුඩා භූමිය - දූපත
210. දිශාව හඳුනාගැනීමේ උපකරණය - මාලිමායන්ත්‍රය
211. කිසි ආඩම්බරයක් නැති - නිහතමානී
212. අලුතින් රටවල් සොයා යන්නා - දේශගවේෂක
213. නොයෙක් දේශවල සංචාරය කරන්නා - දේශාටකයා
214. කන්දක් මැදින් වටවී ඇති දුෂ්කර පාර - ගිරිදුර්ගය

215. කුඩාදෙය ලොකු කර බලන උපකරණය - අන්වීක්ෂය

216. ඈත ඇති දේවල් පැහැදිලිව බලන උපකරණය - දුරේක්ෂය

217. දිනපතා පැවැත්වෙන - දෛනික

218. යම් අසනීපයකට ඔරොත්තු දිය හැකි බලය - ප්‍රතිශක්තිය

219. කිසියම් සමිතියකට බැඳී සිටින අය - සාමාජික

220. කෙනෙකු කළ සේවයට ගරු කිරීම - උපහාරය

221. කුලියක් නොගෙන ගොවිතැන් වැඩවලට එකිනෙකා උදව්කිරීම - අත්තම

222. ගණිතය සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නා - ගණිතඥයා

223. නීතිය ඉගෙන ඇති තැනැත්තා - නීතිඥයා

224. තමාට අවශ්‍ය දේ තමාම නිපදවන - ස්වයංපෝෂිත

225. තවත් කෙනෙකුගේ පිහිටෙන් ජීවත්වන - පරපෝෂිත

226. ජනයා වාසය කරන ප්‍රදේශය - ජනාවාසය

227. දකුණු අත - සුරත

228. ගිහිගෙය හැර යාම - අභිනිෂ්ක්‍රමණය

229. යමක් නැවත අලුත් වැඩියා කිරීම - ප්‍රතිසංස්කරණය

230. යම් ආගමක් මුලින් ම ලොවට දේශනා කළ තැනැත්තා - ශාස්තෘවරයා



231. ගමනක් යාමේදී උවමනා කරන ද්‍රව්‍ය - මාර්ගෝපකරණ

232. අනුන් කරන දේ බලා තමා ද එය කිරීම - අනුකරණය

233. නැව් නවතා තබන ස්ථානය - වරාය

234. අපරාධයක් කිරීමට රහසේ කරන සාකච්ඡාව - කුමන්ත්‍රණය

235. නොකැඩී දිගටම පවතින - අඛණ්ඩ

236. නොනැවතී එක දිගට ගලා යන - අනවරත

237. යකඩින් සාදා ඇති දම්වැල - යදම

238. සභාවක මූලාසනයේ සිටින තැනැත්තා - සභාපති

239. තමන්ගේ දේශයට ඇති ආදරය - දේශානුරාගය

240. අශ්වයාගේ නාදය - හේෂාරවය

241. ඇතාගේ නාදය - කුංචනාදය

242. මොනරාගේ නාදය - කේකාරාවය

243. ආහාර ගැනීමට තද ආශාවක් ඇති - කෑදර

244. බොහෝ කාලයක් පවතින - චිරාත්

245. කිසිවකටත් දෙවන නොවන - අද්විතීය

246. පුරාණ කාලයට අයත් - පෞරාණික

247. සිත් ඇදගන්නා සුළු - සිත්කලු

248. කාලයට ඉතාමත් සුදුසු - කාලෝචිත

249. කෙනෙකු මියගොස් නැවත ඉපදීම - පුනරුත්පත්තිය

250. යුද්ධයේ දී අඳින ලෝහමය ආවරණය - සන්නාහය

251. සතුට ගෙනදෙන ආරංචිය - ශුභාරංචිය

252. තුන් තැනකින් වක් වූ - තිවංක

253. කිසිවෙකට උපමා කළ නොහැකි - අනුපමේය

254. නමක් සඳහන් නොවන - නිර්නාමික

255. අවුරුදු 25 ක් පිරීම - රජතජයන්තිය

256. අවුරුදු පනහක් පිරීම - ස්වර්ණජයන්තිය

257. අවුරුදු සියයක කාලය - සියවස

258. අවුරු දහයක කාලය - දශකය

259. අනුන්ට කරන උදව්ව - පරෝපකාරය

260. කරන ලද උපකාරයට උපකාර කිරීම - ප්‍රත්‍යුපකාරය

261. නිදි නැතිව සිටීම - නිදිවර්ජිත

262. රජුන් වාඩිවෙන ආසනය - සිංහාසනය

263 ජලයේ හැසිරෙන - ජලචර

264. රජ කෙනෙකු නැති - අරාජක

265. කුරුල්ලන් නගන නාදය - කූජනය

266. යකඩින් සාදා ඇති දොර - යදොර